**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රභල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේපල පිරියත උපකරණවල වටිනාකම රු.මිලියන 1,099.97 ක් වූ අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව එය රු.මිලියන 1,099.04 ක් වූයෙන් රු.මිලියන 0.9 ක නොසැසඳු ශේෂයක් විය. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වාර්තා හා දෙපාර්තමේන්තු ගිණුම් පොත් අතර යම් නොසැසදීම් වේ නම් නොපමාව නිවැරදි කර ගත යුතු වීම. | 2019 වර්ෂයේදී මිලදීගත් Polymer Plate Making යන්ත්‍රයෙහි නිෂ්කාශන ගාස්තු හා දේශීය සැපයුම්කරුවන්ගේ ගාස්තු 2020 වර්ෂයේදී CIGAS වැඩ සටහනට ඇතුලත් වීම නිසා ඔබ විසින් දක්වා ඇති පරිදි රු.928,131 ක් මූල්‍ය ප්‍රකාශනයේ ශේෂ අතර නොගැලපීමට හේතු වී ඇත. |

**1.6.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99(xxxiii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ ගමනාන්ත 05 ක නියැදි පරීක්ෂාවට භාජනය වූ මාස හතරකදී චක්‍රලේඛ විධිවිධාන උල්ලංඝනය කරමින් දෙපාර්තමේන්තු වාහන කිලෝමීටර් 10,353 ක් ධාවනය කර තිබුණි. | විධිවිධානවලට අනුකූලව රාජකාරී සඳහා වාහන යොදාගත යුතුවීම. | හදිසි රාජකාරී පවතින අවස්ථා වල රෑ බෝවන තුරුම රාජකාරී ඉටුකිරීමට සිදුවීම ද මෙලෙස චක්‍රලේඛ උල්ලංඝනය කර කටයුතු කිරීමට වූ තවත් හේතුවකි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති 2009 වර්ෂයේ හා ඊට පෙර වර්ෂ සඳහා හිඟ ආදායම් ශේෂය රු.166,058,339 ක් වූ අතර එයින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගත යුතු වීම. | මෙම මුදල අයකර ගැනීම සඳහා හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇති අතර අදාල හිඟ මුදල කපාහැරීමට අනුමැතිය දෙන ලෙස 2020 ජනවාරි 28 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ එකතු හිඟ ශේෂය රු.122,782,608 කින් සියයට 12 කට සමාන වූ රු.15,183,634 ක් පමණක් අයකර ගෙන තිබුණි. | අදාල ණයගැතියන්ගෙන් මුදල් ලබාගැනීමට කටයුතු කළයුතු වීම. | 2020 මැයි 31 දින වන විට හිඟ මුදලින් රු.15,303,039 ක් අයකරගෙන ඇති අතර ඉදිරියේදී මෙම ආයතන දැනුවත් කර හිඟ මුදල් එකතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 05 කින් අයවියයුතු එකතු ණය ශේෂය රු.1,269,269 ක් වුවද, එම ආයතනවලින් ලද සෘජු සනාථ කිරීම් අනුව කිසිදු ණය මුදලක් ගෙවීමට නොමැති බව නිරීක්ෂණය විය. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කර දෙපාර්තමේන්තුට අයවිය යුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතුවීම. | මුද්‍රණ කාර්යයන් ඉටුකර දුන් විවිධ ආයතන වෙත 2009 සිට 2018 දක්වා පවතින හිඟ මුදල් පිළිබඳව දන්වා යැවූ විට බොහෝ ආයතන වලින් පැරණි හිඟ මුදල් පිළිබඳව තොරතුරු නොමැති නිසා ඒ පිළිබඳව නොසලකා හැර ඇත. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂය තුලදී ගෙවා නිදහස් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල වැය විෂයයන් 12 කට අදාළව එකතුව රු.9,094,996 ක මුදලක් ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | මු.රෙ.94(2) ප්‍රකාරව පුනරාවර්තනය වන සැපයුම් සඳහා ඊලඟ මුදල් වර්ෂය තුල බේරුම් කිරීමට සිදුවන බැරකම්වලට බැඳීමට හැක. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | විශ්‍රාම ගිය නිලධාරින් 04 දෙනෙකුගේ අයවිය යුතු එකතුව රු.356,300 ක් වර්ෂ 2 සිට වර්ෂ 5 ඉක්මවන කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය මුදල් ශේෂයන් පසුගිය වර්ෂයන්හිදීද පැවති අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි එම ණය එකතු කර ගැනීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ණයකරු නොමැති අවස්ථාවලදී එම ණය ශේෂ ඇපකරුගෙන් අයකල යුතු වුවද නිලධාරින් 70 කගේ එකතුව රු.3,990,395 ක් වූ ණය ශේෂ ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව අදාල ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

## 3.1 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් නිමකිරීම වෙනුවෙන් ඇතැම් වැඩ කොටස් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමවේදයක් සඳහා 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබාදී තිබුණි. එසේම 2009 සැප්තැම්බර් 11 දින රැස් වූ රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් මෙම සේවක දිරිදීමනා ගෙවීම් සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලෙසට දන්වා තිබූ නමුත් 2020 අගෝස්තු වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. ඊට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කරගෙන මුද්‍රණ නොවන කාර්යයන් සඳහා වැඩ කොටස් අනුව ගෙවීමේ පදනමට එකතුව රු.2,561,775ක් ගෙවා තිබුණි. | 2009 වර්ෂයේදී රාජ්‍ය ගිණුම් කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළයුතුවීම හා සුදුසු දීමනා ක්‍රමයක් කඩිනමින් හඳුන්වා දිය යුතුවීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දැනට පවතින දීමනා ක්‍රමය සරල කරන ලෙසට රාජ්‍ය ගිණුම් කාරක සභාව මෙන්ම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින්ද උපදෙස් ලබාදී ඇති අතර මේ වන විට ඒ සඳහා පියවර ගනිමින් පවතී. සේවකයන්ට පවරා ඇති මුද්‍රණයට අදාලව දෛනික රාජකාරිවලට අමතරව රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් මෙම ගෙවීම් සිදුකර ඇත. |
| (ආ) | උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අතිකාල දීමනා ගෙවීම වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයක් (Piece rate based payment) හඳුන්වා දී තිබුණද, එම තත්ත්වයන් නොසලකා දෙපාර්තමේන්තුවේ ශිල්පීය හා ශිල්පීය නොවන නිලධාරීන්ට (මාණ්ඩලික හා විධායක නිලධාරී ශ්‍රේණි හැර) කැලි පදනම මත දීමනා සහ අතිකාල දීමනා දෙකම ගෙවා තිබුණි. සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ මාස 06 කදී දෙපාර්තමේන්තුවේ වැඩ මූලික නිලධාරීන්ට කැලි පදනම මත දීමනා හා අතිකාල දීමනා ලෙස එකතුව රු.26,879,603 ක් ගෙවා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ වෙනත් දීමනා | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කැලි පදනම මත ගෙවීමේදී අතිකාල දීමනා ගෙවීමට කටයුතු නොකල යුතුවීම හා එසේම නිෂ්පාදන සම්මතයන් (Norms) යාවත්කාලීන කර සේවකයන්ට නිෂ්පාදන ඉලක්ක ලබාදීමට කටයුතු කල යුතුවීම. | මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් ශ්‍රේණි සඳහා අතිකාල කැලි ගණනට දීමනා ගෙවීමේදී ඔවුන් විසින් ඉටුකල යුතු වැඩ කොටස් වෙන වෙනම හඳුනා ගනු ලැබේ. දෛනික නිෂ්පාදන ලෙස ඉටුකල යුතු කාර්යය ප්‍රමාණය යෙදුනු අතිකාල වෙනුවෙන් ඉටුකල යුතු කාර්යය ප්‍රමාණය යන දෙකෙහි එකතුව ඔහු විසින් ඉටු කරන ලද සමස්ත නිෂ්පාදනයෙන් අඩු කිරීමෙන් පසුව |

| | | | |
|---|---|---|---|
| | ලෙස ගෙවන ලද රු.824,337,563 ක් සඳහා ආයතන අධ්‍යක්ෂ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | ඉතිරිවන ප්‍රමාණයට පමණක් අතිකාල දීමනා ගෙවනු ලබයි. |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් තම මුද්‍රණ කාර්යයන්හිදී ඉතිරි වන කඩදාසි (අස්කොන් කඩදාසි) විකිණීමේ ක්‍රියාවලියට අදාල ලංසු ප්‍රදාන ලිපියේ 2.2 වගන්තිය ප්‍රකාරව අලෙවි වන සෑම කඩදාසි තොගයක්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට ප්‍රථම රු. 200,000ක් අත්තිකාරම් වශයෙන් තැන්පත් කළ යුතු අතර, 2.5 වගන්තිය ප්‍රකාරව බර කිරා අවසන් වූ පසු එදිනට නියමිත බර ප්‍රමාණයට අදාල ඉතිරි වටිනාකම මුදලින් ගෙවා නිරවුල් කල යුතුය. හිඟ බිල් පත් පියවන තුරු තොග ඉවත් කර ගත නොහැකි වුවද, අවස්ථා 13 කදී පුද්ගලික සමාගමක් මිලදී ගත් පිරිවැය රු. මිලියන 2.1 ක් වූ කිලෝග්‍රෑම් 47,912 ක් සඳහා දින 30 සිට දින 160 ක කාල ප්‍රමාදයකින් පසු ගෙවීම් කර තිබුණි. ඊට අමතරව පුද්ගලයකු අවස්ථා 08 කදී මිලදී ගත් වටිනාකම රු. 1,398,800 ක්වූ කිලෝග්‍රෑම් 38,377 ක් සඳහා දින 34 සිට දින 62 ක ප්‍රමාද කාලයකින් පසු ගෙවා තිබුණි. තවද මුද්‍රණ කාර්යයන්හිදී එකතු වන අස්කොන් කඩදාසි ආරක්ෂිතව ගබඩා කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබීම හේතුවෙන් එම කඩදාසි වර්ෂාවට නිරාවරණය වී තිබුණු අතර ඒ තුළින් එම කඩදාසි සඳහා සාපේක්ෂව වැඩි මිලක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | ගැනුම්කරු සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සියලු මුදල් නොපමාව අයකර ගතයුතුවීම සහ අස්කොන් කඩදාසි තොග ආරක්ෂිතව ගබඩා කළ යුතු වීම. | ටෙන්ඩර් ප්‍රදානය කර තිබූ ගැනුම්කරුවන් දෙදෙනෙකු විසින් තව දුරටත් කිසියම් හිඟ මුදල් ප්‍රමාණයක් ගෙවීමට ඇති අතර , එම මුදල් නිසි පරිදි ගෙවා නිම කිරීමට කටයුතු කරන ලෙසත් , එසේ නොකලහොත් ඔවුනට විරුද්ධව නීති මඟින් කටයුතු කිරීමට පියවර ගනු ලබන බවත් ලිඛිතව දැනුම්දීම් කර ඇත. අස්කොන් කඩදාසි එක්රැස්කරන ගොඩනැගිල්ල පුළුල් කර මෙම තත්ත්වය කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2019 මාර්තු 28 දිනැති අංක EST/ALLOW/03/0720 දරන ලිපියට අනුව ආධුනික නිලධාරීන්ට පුහුණු කාලය තුල දෛනික දීමනාව ලෙස රු.700 ක් ගෙවන ලෙසට දන්වා තිබුණි. එහෙත් එම දීමනාවට අමතරව වෙනත් දීමනා හා අතිකාල දීමනා ලෙස 2019 වර්ෂයේදී එකතුව රු.21,813,006ක් | චක්‍රලේඛ වල සඳහන් දීමනා පමණක් පුහුණුලාභීන්ට ගෙවීම් කල යුතුවීම හා මුද්‍රණ සේවා ව්‍යවස්ථාව අනුව අදාල අභ්‍යාසලාභීන් විසින් සිය වෘත්තීය සුදුසුකම් මට්ටම් සපුරාගත යුතුවීම. | ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටම සම්පූර්ණ කල යුතුවීම හා මෙම ආධුනිකයන්ට සේවා අවශ්‍යතාවය නිසා එලෙස මුදල් ගෙවා ඇත. |

අදාල ආධුනිකයන්ට ගෙවා තිබුණි. තවද දැනට ශ්‍රී ලංකාවේ ස්ථාපනය කර නොමැති මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හි පස්වන මට්ටම සඳහා පාඨමාලා පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට 2018 වර්ෂයේදී රු.7,321,600 ක් ගෙවා තිබුණි.

(ඉ) 2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා ඡන්ද පත්‍රිකා හා වෙනත් මැතිවරණ ලිපි මුද්‍රණය කිරීම සඳහා මැතිවරණ කොමිසම විසින් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට එකතු කල අගය මත බදු සහිතව රු.349,885,286 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) ඡන්ද පත්‍රිකා පොතක් මුද්‍රණයේදී වැයවන කඩදාසි පිරිවැය කිසිඳු පිළිගත හැකි හේතුවක් නොමැතිව රු.13,543,814 කින් වැඩි කර තිබූ අතර ඡන්ද පත්‍රිකා පොතක් මුද්‍රණයේදී වැයවන ද්‍රව්‍ය ශ්‍රමය හා පොදුකාර්ය පිරිවැයට අමතරව එක් ඡන්ද පත්‍රිකා පොතක් සඳහා කිසිඳු පිළිගත හැකි හේතුවක් නොමැතිව රු.80ක් අතිරේකව ඉන්වොයිසියට එකතු කර තිබුණි. එමනිසා ඉන්වොයිස් වටිනාකම රු.28,568,000 කින් වැඩිවී තිබුණි.ඒ අනුව ඡන්ද පත්‍රිකා පොත් 357,100 ක් මුද්‍රණයේදී රු.42,111,814 ක් මැතිවරණ කොමිසමෙන් වැඩිපුර අයකරගෙන තිබුණි. එලෙසම ද්විත්ව ඡන්ද පත්‍රිකා පොතක් මුද්‍රණයේදී වැයවන ද්‍රව්‍ය ශ්‍රමය හා පොදුකාර්ය පිරිවැයට අමතරව කිසිඳු පිළිගත හැකි හේතුවක් නොමැතිව රු.42 ක් අතිරේකව එකතු කිරීම නිසා එකතුව රු.750,456 ක් මැතිවරණ කොමිසමෙන් වැඩිපුර අයකරගෙන තිබුණි .ඒ අනුව මෙම ඡන්ද පත්‍රිකා මුද්‍රණයේදී මුද්‍රණ | මැතිවරණ කොමිෂන් සභාව සිය වියදම් මූල්‍යකරණය කරනුයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් බැවින් පිළිගත හැකි හේතු නොමැතිව පිරිවැය වැඩි නොකළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.42,862,270 ක් මැතිවරණ කොමිසමෙන් වැඩිපුර අයකර ගෙන තිබුණි. ඒ තුලින් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් 24 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී වාණිජ මුද්‍රණ දීමනාව ලෙස එකතුව රු.965,684 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ii) | දෙපාර්තමේන්තුවේ සේවකයන්ට කැලි පදනම මත දීමනා , වෙනත් දීමනා සහ විශේෂ දීමනා ගෙවීමට සමාලෝචිත වර්ෂයේදී රු.745,580,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දී තිබියදී මෙම මැතිවරණ මුද්‍රණ කාර්යය සඳහා කැලි පදනම මත දීමනා සහ විශේෂ දීමනා ලෙස හඳුනාගනිමින් රු.128,200,493ක් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නොවන නිලධාරීන්ට ගෙවා තිබුණි. තවද මැතිවරණ මුද්‍රණ කටයුතු වෙනුවෙන් වාණිජ මුද්‍රණ දීමනාව ලෙස රු.7,290,826 ක් මාණ්ඩලික නිලධාරීන්ට ගෙවා තිබුණු අතර එම දීමනා සඳහා එකතුව රු. 135,491,319 ක් මැතිවරණ කොමිෂන් සභාවෙන් අයකරගෙන තිබුණි. එසේ මුදල් අයකර ගැනීම නිසා එක් ඡන්ද පත්‍රිකා පොතක ඉන්වොයිස් මිල රු.400 සිට රු.677 දක්වා වැඩි වී තිබුණි.<br>මෙලෙස කැලි පදනම මත දීමනා සහ විශේෂ දීමනා ලෙස මැතිවරණ කොමිෂමෙන් රු.128,200,493 ක් අයකර ගෙන තිබියදී රු.745,580,000 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන භාවිතා කර ඉහත මුද්‍රණ කාර්යයේ නිරත වූ මුද්‍රණ සේවකයන්ට උක්ත ගෙවීම් වලට අමතරව කැලි පදනම මත දීමනා , විශේෂ දීමනා සහ අතිකාල දීමනාද ගෙවා එම මුද්‍රණ කටයුතු කරන | කැලි පදනම මත දීමනා සහ විශේෂ දීමනා ලෙස මැතිවරණ කොමිෂමෙන් අයකර ගැනීමත් එම කාර්යයම සඳහා කැලි පදනම මත දීමනා ලෙස දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත නැවත වරක් ගෙවීම් කිරීමත් නොකළ යුතුවීම. | මැතිවරණයට අදාලව ඡන්ද පත්‍රිකා මිලියන 17.9 ක් පමණ දින 28 ක් වැනි ඉතා කෙටි කාලයක් තුලදී මුද්‍රණය නිම කල යුතුව තිබුණි.ඒ වෙනුවෙන් රු.135,102,656 ක් මැතිවරණ දීමනා ලෙස ගෙවා ඇති බැවින් එක් ඡන්ද පත්‍රිකා පොතක පිරිවැය රු.677 ක් විය.එලෙසම ඉහත පරිදි ගෙවූ දීමනා ගැලපූ විට ද්විත්ව ඡන්ද පත්‍රිකා පොතක ඉන්වොයිස් මිලද රු.296 ක් දක්වා වැඩිවී තිබුණි. |

කාලය තුල නොමිලේ ආහාර පානද ලබා දී තිබුණි. එලෙස කැලි පදනම මත දීමනා ලෙස එකතුව රු.1,172,469 ක මුදලක් ගෙවා ඇති බවට නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය.

### 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 අධ්‍යයන වර්ෂය සඳහා දහම් පාසල් පොත් මුද්‍රණය කර 2019 ජුනි 30 දින හෝ ඊට පෙර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට එම දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතවී තිබුණ ද විවිධ ශ්‍රේණි සඳහා වන දහම් පාසල් පොත් මුද්‍රණය කර භාර දීමේදී දින 01 සිට දින 37 දක්වා ප්‍රමාද කාලයක් නිරීක්ෂණය විය. | ගිවිසුම්වල සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | 2020 පාසල් අධ්‍යයන වර්ෂය සඳහා පාසල් පෙළ පොත් වර්ග 22 ක් මුද්‍රණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ලංසු ඉදිරිපත් කර තිබු නමුත් එයින් පොත් වර්ග 6 ක් පමණක් ලංසුවේදි ජයග්‍රහණය කිරීමට හැකි වි තිබුණි. වෙනත් මුද්‍රණ ආයතන ඉදිරිපත් කරන මිල ගණන් වලට වඩා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සියයට 4 සිට සියයට 31 දක්වා පරාසයකින් වැඩිවීම ඊට හේතුවී තිබුණි. | මුද්‍රණ කටයුතු හිදී දෙපාර්තමේන්තු මිල ගණන් ඉහල අගයක් ගැනීමට බලපා ඇති හේතු පිළිබඳව නැවත සලකා බලා මිල ගණන් තීරණය කළයුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3 ප්‍රසම්පාදනයන්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 33 වන පරිච්ඡේදයෙහි 2.1.4.1 ඡේදයට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.4,468,788 ක් වන නවීකරණ කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ දේදුනු පිටුවල නම සඳහන් සැපයුම්කරුවන් නොවන ආයතනවලින් අවස්ථා 14 කදී මිල ගණන් කැඳවා තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ඉතා හදිසි හා අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු කිහිපයක් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ඉහත නියමයන්ගෙන් පරිබාහිරව මිලදී ගැනීම් සිදුකර ඇත |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.22 ඡේදය ප්‍රකාරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමයේදී ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 07 ක් වුවද ප්‍රසම්පාදන කමිටුව විසින් එකතු වටිනාකම රු.6,474,558 ක් වූ අවස්ථා 17 කදී ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ කියවීම් අංශයේ සහ පරිගණක අංශයේ වර්ග අඩි 6500 ක ඉඩ ප්‍රමාණයක ඇතිරීම සඳහා බිම් ගඩොල් (Floor Tiles ) 1700 ක් රු.1,219,563 කට මිලදී ගෙන තිබුණි.මෙම කාර්යය භෞතිකව පරීක්ෂාවේදී බිම් ගඩොල් 1000 ක් පමණක් අසුරා තිබූ අතර රු.502,173 ක් වටිනා ඉතිරි බිම් ගඩොල් 700 ක ප්‍රමාණය ආපසු ගබඩාවට භාරදී නොතිබූ අතර ඒ පිළිබඳව පැහැදිලි කිරීමට අදාල නිලධාරීන් අපොහොසත් විය. පසුව එම කාර්යය නිම කිරීමට වටිනාකම රු.578,263 ක් වටිනා බිම් ගඩොල් 700 ක් වෙනත් තැනකින් මිලදී ගෙන තිබුණි. | බිම් ගඩොල් ඇතිරීම පිළිබඳ පරීක්ෂණයක් පවත්වා අදාල ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීම. | පරිගණක අංශයේ එම බිම් ගඩොල් ඇතිරීමෙන් පසු ඉතිරිය කියවීම් අංශයේ අලුත්වැඩියාවන් සඳහා යොදාගෙන ඇත. නැවත පරිගණක අංශය සඳහා වෙනම බිම් ගඩොල් මිලදී ගැනීමක් සිදුකර නැත. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට නොමිලේ දියර කිරි ලබාදීමට සමාලෝචිත වර්ෂයේදී රු. 18,445,912 ක් වැය කර තිබුණි. දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වාතාශ්‍රයේ පැතිර පවතින විවිධ විෂ ද්‍රව්‍ය ශරීර ගත වීමෙන් සෑදෙන රෝගාබාධ වලක්වා ගැනීම සඳහා සියළුම කාර්ය මණ්ඩලය වෙත දියර කිරි සැපයීමට පියවර ගෙන තිබුණද, රජයේ මුද්‍රණාලයාධිපති අමතන ලද 1986 පෙබරවාරි 07 දිනැති අංක O/H/M/33 දරන නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (වෘත්තීය සෞඛ්‍ය) ගේ ලිපිය අනුව එලෙස දියර කිරි පානයෙන් විෂ ද්‍රව්‍ය ශරීරගත වීම වැළැක්වීම සිදු නොවන නිසා කිරි ලබාදීම නතර කරන ලෙස දන්වා තිබුණි. | දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වාතයේ විවිධ විෂ ද්‍රව්‍ය පවතින බවට තහවුරු කර ගැනීමට සුදුසු පරීක්ෂණ පළමුව සිදු කිරීමත්,එලෙස අහිතකර තත්ත්වයක් පවතීනම් එම තත්ත්වය සමනය කිරීමට විශේෂඥ උපදෙස් මත අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමත් සිදුකල යුතුවීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත දීර්ඝ කාලයක පටන් ලබාදුන් සුභසාධක ක්‍රියාවලියක් ක්ෂනිකව නැවැත්වීමේ හැකියාවක් නොමැති බව<br>මෙහිදී සැලැකිල්ලට ගත යුතු ප්‍රධානතම කරුණකි. එසේම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිසරයේ දූවිලි අංශු සහ විවිධ විස රසායන අංශු බහුල වශයෙන් පැතිර පැවතීම මෙලෙස පෝෂ්‍යදායී කිරි පැකට් ලබාදීම කෙරෙහි පාදක කරගත් තවත් කරුණක් වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2001 මැයි 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2001 හි 3 වන ඡේදයේ සඳහන් උපදෙස් ප්‍රකාරව දෙපාර්තමේන්තුව තුල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව තුල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයක් ස්ථාපිත කළයුතු වීම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2001 හි අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයන් ස්ථාපිත කළ යුතු බව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව පුහුණු පාඨමාලා 30 ක් පවත්වා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී සැලසුම් කරන ලද පුහුණු පාඨමාලා ප්‍රමාණය 11 ක් දක්වා අඩු කර තිබුණි. එම පුහුණු පාඨමාලා 11 න් 02 ක් පමණක් මුද්‍රණ කාර්ය හා සම්බන්ධ පාඨමාලා විය. | මුද්‍රණ කටයුතු වල නිරත වන නිලධාරින්ට පුහුණු අවස්ථා ලබාදිය යුතු වීම. | 2019 වර්ෂය සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන එම ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව උපයෝජනය කිරීම සඳහා මෙලෙස පුහුණු වැඩ සටහන් ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු කිරීමට සිදුවී ඇති බව කාරුණිකව වාර්තා කරමි. |